// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2377/09 - 2024 මාර්තු මස 25 වැනි සඳුදා - 2024.03.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: BKP/LAN/ACQUI/D2/3-2.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/05/2014/HW/407.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ /පරවශතාවයේ විස්තර*:

කැගල්ල දිස්ත්‍රික්කයේ, බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 129 බී බුලත්කොහුපිටිය වසමේ , බුලත්කොහුපිටිය ගමේ පිහිටි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0106 ක් වූ අංක 3701 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 1 මැන විස්තර කර ඇති පහත සඳහන් අය හිමිකම් කියන ඉඩම් කොටස.

**01. කැබලි අංක 1**
ඉඩමේ නම: ගිනිවලපිටිය වත්ත; හිමිකම් කියන අය: එම්.ආර්. ගුණවර්ධන; ප්‍රමාණය: හෙක්: 0.0106.

ඉහත සඳහන් ඉඩමට/ පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2024 මැයි මස 29 වැනි දින පෙ.ව. 10.00 ට බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2024 මැයි මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/ පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එච්. ඩී. එස්. එන්. හෙට්ටිගේ,
ප්‍රාදේශීය ලේකම්,
බුලත්කොහුපිටිය.

2024 මාර්තු මස 20 වැනි දින,
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03-0201